# කෝලාට්ටම් නැටුම හඳුනා ගනිමු.



1 රූපය



2 රූපය

ඉහත පළමු රූපයේ ඇත්තේ ද්‍රවිඩ ගැමි නැටුමක් වන කෝලාට්ටම් නර්තනයයි. එය සිංහල ගැමි නැටුමක් වන ලී කෙළි නර්තනයට සමාන වේ. ලී දෙකක් තාලයට ගසමින් ඉතාම සරල පද යොදාගෙන මෙම නැටුම නිර්මාණය කරයි.

දෙවන රූපයෙන් දැක්වෙන්නේ පින්නල් කෝලාට්ටම් ය. එහිදී කණුවකට බඳින ලද පටි ලී දෙකට සම්බන්ධ කරමින් කණුව වටේ රටා මෝස්තර වියමින් රඟ දැක්වීම විශේෂත්වයකි. සිංහල ගැමි නැටුම් වලදී මෙය ලී මල්ලිය නමින් හඳුන්වයි. තෛපොංගල් උත්සවයේදී හා විනෝදය අරමුණු කරගත් සමාජ උත්සව වලදී කෝලාට්ටම් නර්තනය දැකිය හැකිය.

ක්‍රියාකාරකම

1. සිංහල ගැමි නැටුමක් වන ලී කෙලි නැටුම හා සමාන ද්‍රවිඩ ගැමි නැටුම නම් කරන්න.
2. පින්තල් කෝලාට්ටම්වල විශේෂත්වය කුමක්ද?
3. කෝලාට්ටම් නර්තනය දැකිය හැකි අවස්ථා නම් කරන්න.
4. වැඩිහිටි උදව් ඇතිව අන්තර්ජාලය ඇසුරෙන් කෝලාට්ටම් නර්තනයක් නරඹන්න.
5. ඒ ඇසුරින් සරල පද දෙකක් නිර්මාණය කිරීමට උත්සාහ කරන්න.